# බුලත්සිංහල ප්‍රාදේශීය සභාව
# කළුතර දිස්ත්‍රික්කය

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015අප්‍රේල් 01 දින ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014අප්‍රේල් 02 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 ජූලි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2014 දෙසැම්බර් 31 දිනට බුලත්සිංහල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කර්මාන්ත ණයහිමි ආරම්භක ශේෂය රු.6,147,841 ක් වුවද ආරම්භක කර්මාන්ත ණයහිමි ශේෂය ලෙස රු.14,573,213 ක් ගිණුම් ගත කිරීමෙන් සිදු වූ වරද නිවැරදි කිරීමට සමුච්චිත අරමුදලට රු.8,425,372 ක් බැර කළ යුතු වුවත් රු.10,345,509 ක් බැර කිරීම හේතුවෙන් රු.1,920,137 කින් සමුච්චිත අරමුදල වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2014 නොවැම්බර් මස සභික දීමනා වෙනුවෙන් වැය කළ මුදල රු.190,000 ක් වුවත්, එය රු.65,000 ක් ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ හේතුවෙන් ලැබිය යුතු වැටුප් ප්‍රතිපූර්ණ ශේෂය රු.125,000 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) රු.4,650 ක් වූ සේවක ඇප සහතික වටිනාකම හා රු.71,400 ක් වූ බැංකු ගිණුම්වල වූ සේවක ඇප වටිනාකම වගකීම් යටතේ දක්වා නොතිබීම හේතුවෙන් ජංගම වගකීම් රු.76,050 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සභාවේ සමස්ථ සේවක ඇප තැන්පත් ආයෝජන වටිනාකම රු.79,050 ක් වන අතර ශේෂ පත්‍රයේ ජංගම වත්කම් යටතේ සේවක ඇප තැන්පත් ආයෝජන ලෙස රු.15,070 ක වටිනාකමක් පමණක් දක්වා තිබීම හේතුවෙන් ජංගම වත්කම් රු.63,980 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයට අදාලව ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.477,366 ක් බව මූල්‍ය ප්‍රකාශන සැකසීමට පෙර හඳුනාගෙන තිබුණද ලැබිය යුතු උසාවි දඩ වශයෙන් රු.666,250 ක මුදලක් බිල් කළ ආදායම ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ උසාවි දඩ ආදායම රු.188,884 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) 2014 වර්ෂයට අදාලව සමාලෝචිත වර්ෂය තුළ හා 2015 වර්ෂයේ මුල් කාර්තුව තුළ ලද මුද්දර ගාස්තු ආදායම රු.6,744,394 ක් වුවත් 2012, 2013 වර්ෂ සඳහා ලද රු.4,928,267 ක මුදල පමණක් සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස ගිණුම් ගත කර තිබීම හේතුවෙන් වර්ෂයේ ආදායම රු.1,816,127 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(උ) 2014 වර්ෂයේ ආදායම් ගිණුම් තැබීමේදී වර්ෂයට අදාල ආදායම නිසි පරිදි බිල් නොකිරීම හේතුවෙන් වර්ෂය තුළදී ප්‍රවර්තන වර්ෂයට අදාල ලැබීම්, බිල් කළ ආදායමද ඉක්මවීම හේතුවෙන් ලැබිය යුතු හිඟ ආදායම ප්‍රවර්තන වර්ෂයට අදාල ආදායමට හිලව් වීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම හා ඉදිරියට ගෙන ගිය හිඟ ආදායම රු.143,052 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

2. **<u>මූල්‍යසමාලෝචනය</u>**

2.1 **<u>මූල්‍ය ප්‍රතිඵල</u>**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.3,672,077 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදයම රු.26,077,824ක් විය.

2.2 **<u>ආදායම් පරිපාලනය</u>**

2.2.1 **<u>ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්</u>**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| (i) වරිපනම් හා බදු | 136 | 5 | 131 |
| (ii)අක්කර බදු | 113 | -- | 112 |
| (iii)කර්මාන්ත බදු | 74 | 3 | 71 |
| (iv)ව්‍යාපාර බදු | 204 | 42 | 162 |
| (v) බදුකර කුලී | 546 | - | 546 |

2.2.2 **<u>වරිපනම් බදු</u>**

2014 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු ශේෂය රු.108,072 ක් වූ අතර ඉන් රු.126,109 ක් විගණිත දිනය වූ 2015 ජූනි 15 වන විටත් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.3 **<u>අක්කර බදු</u>**

2011 වර්ෂයට පෙර සිට පැවත එන රු.83,984 ක් වූ අක්කර බදු ශේෂය විගණිත දිනය වූ 2015 ජූනි 15 වන විටත් අයකරගැනීමට කටයුතු කර නොතිබුණි.

2.2.4 **<u>වෙළඳ බලපත්‍ර</u>**

2014 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති වෙළඳ බලපත්‍ර ශේෂය වූ රු.41,456 කින් ව්‍යාපාර 28 කට අදාල රු.23,825 ක් විගණිත දිනය වූ 2015 ජූනි 15 වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.5 **<u>ව්‍යාපාර බදු</u>**

2014 දෙසැම්බර් 31 දිනට ව්‍යාපාර ස්ථාන 51 කින් ව්‍යාපාර බදු රු.30,720 ක් හිඟව පැවති අතර විගණිත දිනය වූ 2015 ජූනි 15 වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.6 **<u>කර්මාන්ත බදු</u>**

2014 දෙසැම්බර් 31 දිනට හිඟව පැවති රු.32,350 ක් වූ කර්මාන්ත බදු ශේෂයෙන් රු.5,500 ක් විගණිත දිනය වූ 2015 ජූනි 15 වන විටත් අයකරගෙන නොතිබුණි.

2.2.7 **වෙළඳ නාම පුවරු ගාස්තු**

2014 වර්ෂය සඳහා වෙළඳ නාම පුවරු ගාස්තු වශයෙන් රු.75,000 ක් ඇස්තමේන්තු කර තිබුණද සමාලෝචිත වර්ෂය සඳහා කිසිදු ආදායමක් අයකරගෙන නොතිබුණි. ආදායම් පරිපාලකවරුන්ගේ ඉදිරි වැඩසටහන් සැකසීමේදී මේ පිළිබඳ කිසිදු සැලසුමක් සකස් කර නොතිබුණි.

2.2.8 **උසාවි දඩ හා මුද්දර ගාස්තු**

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 666,250 |
| (ii) | මුද්දරගාස්තු | 4,928,267 |

3. **මෙහෙයුම් සමාලෝචනය**

3.1 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

3.1.1 **තාවකාලික පදිංචිකරුවන් සඳහා ස්ථිර වාසස්ථාන ලබාදීම**

බුලත්සිංහල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ඇගල්ඔය රාජාලිමානාන මාර්ගය යාබද අක්කර 2 ½ ක් පමණ වූ ඉඩමේ පවුල් 70 ක් තාවකාලිකව පදිංචි වී සිටිති. ඔවුන්ට ස්ථිර වාසස්ථාන සපයමින් ප්‍රජා සංවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීමට එහි පදිංචිකරු වන ත්‍රී ඒතර් සත්ව ගොවිපලේ අයිතිකරු 2012 දෙසැම්බර් 14 දින එකඟතාවය පළ කර තිබුණි. මේ සම්බන්ධ නීත්‍යානුකූල ලියවිලි සැකසීම හා ක්‍රියාකාරී සැලසුමක් පිළිබඳව උපදෙස් ඉල්ලා පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත ලිඛිතව දැනුම් දී තිබුණි.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 108(ඌ) වගන්තියේ විධිවිධාන අනුව ආදල ආයතනයෙන් පිඹුරක් හා ඔප්පුවක් මගින් ඉඩම ලබාගෙන එය නැවත අණු බෙදීම් කර පිඹුරුපත් සකස් කර වෙන වෙනම ඔප්පු සකස් කිරීමට පළාත් පාලන සහකාර කොමසාරිස් විසින් 2012 දෙසැම්බර් 30 දින උපදෙස් ලබාදී තිබුණි. 2014 සැප්තැම්බර් 12 දින මාසික මහා සභා රැස්වීමේදී බුලත්සිංහල ප්‍රාදේශීය සභාවට ත්‍යාගයක් ලෙස ඉඩම භාර ගැනීමට එකඟතාවය පළ කර 2014 ඔක්තෝබර් 27 දින ගොවිපලේ අයිතිකරුට දැනුම් දී තිබුණද 2015 ජූනි 19 වූ විගණිත දින දක්වා මෙම ඉඩම අනුබෙදුම කර අදාල පවුල් වෙත පැවරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

3.1.2 **ආර්ථික නොවූ ක්‍රියාකාරකම්**

(අ) ආදායම් උත්පාදනය කිරීමේ අරමුණින් ඉදි කර ඇති වාහන හා සේවා නඩත්තු කිරීමේ ඒකකයේ අපේක්ෂිත ආදායම රු.1,000,000 ක් වුවද, වර්ෂය තුළ කිසිදු ආදායමක් උපයා නොතිබුණි. ඉදිකිරීම් භාණ්ඩ සපයා ගැනීම හා වැටුප් වෙනුවෙන් දැරූ මූලික පිරිවැය වූ රු.267,275 ක් ආවරණය කිරීමට මෙම ව්‍යාපෘතියෙන් අපොහොසත් වී ඇති අතර, පිරිවැය ප්‍රතිලාභ සැසඳීමේදී ඵලදායී ලෙස ක්‍රියාත්මක වී නොතිබුණු බව අනාවරණය විය.

(ආ) පොලේගොඩ ආදාහනාගාර භූමියට අයත් ඉඩමේ පැවති කොස් ගස් 02 ක්, අඹ ගස් 01 ක් හා පොල් ගස් 03 ක් 2014 සැප්තැම්බර් 26 - 29 දිනයන්හිදී කපා දමා තිබූ අතර 2015 ජූනි 19 වූ විගණිත දින දක්වා එම ගස් පොලේගොඩ පුස්තකාල භූමියේ අසුරා තිබීම හේතුවෙන් එම දැව සඳහා ආර්ථිකමය වටිනාකමක් සභාව වෙත ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි.

3.1.3 **ඇඟිලි සළකුණු යන්ත්‍රය අක්‍රීයව පැවතීම**

ඇඟිලි සළකුණු යන්ත්‍රය 2013 අප්‍රේල් 19 දින අක්‍රිය වී අළුත්වැඩියාව සඳහා 2013 නොවැම්බර් 03 දින පෞද්ගලික ආයතනයක් වෙත භාර දී තිබුණි. අළුත්වැඩියා වියදම් රු.54,264 ක් 2014 දෙසැම්බර් 15 දින වැය කර තිබුණද විගණිත දිනය වූ 2015 ජූනි 22 දින වන තෙක් ඇඟිලි සළකුනු යන්ත්‍රය සභාවේ සවි කර ක්‍රියාත්මක කර නොතිබුණි.

3.1.4 **සේවක ණය**

සේවය හැර ගිය, විශ්‍රාම ගිය හා මිය යාම් වැනි හේතු නිසා සේවකයන් 4 දෙනෙකුගෙන් 2011 වර්ෂයේ සිට අයවිය යුතුව පැවත එන රු.166,664 ක් වූ සේවක ණය ශේෂය 2014 දෙසැම්බර් 31 දිනටද අයකරගෙන නොතිබුණි.

3.2 **කොන්ත්‍රාත් පාලනය**

**ප්‍රාදේශීය සභා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීම**

පළාත් නැගුම වැඩසටහන යටතේ රු.මිලියන 20.5 ක ඇස්තමේන්තුගත වටිනාකමැතිව අනුමත වී තිබුණ ප්‍රාදේශීය සභා නව කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව පුද්ගලික ආයතනයක් වෙත රු.16,039,888 කට පිරි නමා තිබුණි. 2015 ජූනි 22 දින සිදු කළ භෞතිකපරීක්ෂාවේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) කුළුණු හා බිත්ති එකතු වන ස්ථානයන්හි සිරස් පිපිරුම් සළකුනු දක්නට ලැබුණි. මෙම පිපිරුම් සළකුනු බිම් මහලෙහිද මද වශයෙන් පළමු මහලෙහි බොහෝ ස්ථානයන්හිද (පොටි ආලේප කරන ලද කපරාදුවෙහි මතු පිට) දක්නට ලැබුණි.

(ආ) ජනෙල් හා කවුළුවල පහල දෙකොණින් ආරම්භ වී ඇති පිපිරුම් සළකුනුද තිබූ අතර පඩි පෙළ අසල තලාදය හා බිත්ති එක්වන ස්ථානයේ තිරස් පිපිරුම් සළකුනු දක්නට ලැබුණි.

(ඇ) බිම් මහළෙහි ජනෙල් කවුළු වැසි ජලයට නිරාවරණය වී තිබුණු අතර වැහි ආවරණයක අවශ්‍යතාවයට දක්නට ලැබුණි.

3.3 **අයවැය පාලනය**

(අ) 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව සභාවේ අයවැයගත සමස්ථ පුනරාවර්තන ආදායම රු.94,464,045 ක් වුවද, තථ්‍ය ආදායම රු.16,771,377 ක් වීමෙන් අයවැයගත ආදායමෙන් සියයට 17 ක ඉලක්කයක් පමණක් සපුරාගෙන තිබුණි.

(ආ) 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයයන් 56 ක් සඳහා එකතුව රු.9,769,000 ක් වූ මුදලක් වෙන් කර තිබූ නමුත් වර්ෂය අවසානයට ඉන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව අනාවරණය විය.

(ඇ) අදාල කාර්යය ඉටු නොකිරීම හේතුවෙන් රු.4,257,500 ක වෙන් කළ ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී ඇති වැය ශීර්ෂයන්ගෙන් ප්‍රතිපාදිත මුදල් වෙනත් වැය ශීර්ෂවලට මාරු කර තිබුනු අවස්ථාවන් නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රතිපාදන සැලසීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු කරගැනීමට ක්‍රියාත්මක වී නොතිබුණු බව විගණනයට තහවුරු විය.

4. **පද්ධති හා පාලන**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) ආදායම් පරිපාලනය

(ඇ) අයවැයකරණය